**ශීර්ෂය 175 රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය.**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය.**
**------------------------------------------------------------------------**

**1.1 විගණන විෂය පථය.**

**-----------------------**

රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

**------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය.**

**------------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම මෙහි (අ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම්.**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i). මුළු ප්‍රතිපාදනය හා වියදම.**

----------------------------

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.834,546,865 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.778,994,830 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.55,552,035 ක් හෙවත් සියයට 6.6 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපානදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 110,769,415 | 84,190,330 | 26,579,085 | 24 |
| මූලධන | 723,777,450 | 694,804,500 | 28,972,950 | 4 |
| එකතුව | 834,546,865 | 778,994,830 | 55,552,035 | 6.6 |

**(ii). අයවැය විචලනය.**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.763,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

- වැය විෂයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 58 සිට සියයට 92 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(iii). රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්.**

---------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්.**

----------------------------------------------

අමාත්‍යාංශයට අදාළ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 17501 | 5,000,000 | 2,544,000 | 1,500,000 | 2,164,654 | 20,000,000 | 10,397,218 |

**(iv). පොදු තැන්පත් ගිණුම්.**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රු.3,140,978 ක් වී තිබුණි. වර්ෂ 02 ක් ඉක්මවූ රු.447,853 ක් වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.4 වත්කම් කළමනාකරණය.

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

2013 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.**

සංස්ථාවකට අයත් වාහනයක් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් 2013 මැයි 06 දින සිට භාවිතයට ගෙන තිබුණු අතර වැවිලි සමාගමකට අයත් වාහනයක්ද එසේ භාවිතයටද ගෙන තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්.**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු බේරුම් නොකළ බැරකම් රු.795,508 ක් විය.

## 1.5 අනුකූල නොවීම්.

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 139 (4) | 9,471,843 | ලදුපත් නොමැතිව ගෙවීම් කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 231(1) හා 237(අ) | 343,490 | මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කමිටු තීරණ, ඉන්වොයිස්පත් හා ඉන්වෙන්ට්‍රි සහතික වවුචරයට අමුණා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1646 | - | ගමන් පිළිබඳ මාසික සංසිද්ධි වාර්තා හා දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත එවිය යුතු වුවත්, 2013 වර්ෂයට වාහන 06 කට අදාළ මාසික සංසිද්ධි වාර්තා හා දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | අමාත්‍යාංශය සතු වාහනවල මාස 06 කට වරක් දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |

**1.6 මානව සම්පත් කළමනාකරණය.**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 14 | 05 |
| (ii) | තෘතීයික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 56 | 32 | 24 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 36 | 34 | 02 |
| | එකතුව | 114 | 82 | 32 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 32 ක් පිරිවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.